# දෙමව්පියන් රැකියා සඳහා විදේශගත වීම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි සිදු කරන බලපෑම (පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ඩබ්ලිව්. එම්. නදීරා දසනායක***[1]

***සීතා පී. බී. රණතුංග***[2]

සංක්ෂේපය

ශ්‍රී ලංකාව තුළ රැකියා සඳහා විදේශගත වීමේ වැඩි ප්‍රවණතාවක් වර්තමානයේ දී දැකිය හැකි වන අතර 2010 වසරේ සිට විදේශ රැකියා සඳහා වන ස්ත්‍රී දායකත්වය ඉක්මවා යන පුරුෂ දායකත්වයක් පැවතීම කැපී පෙනෙන ලක්ෂණයකි. විශේෂයෙන්ම මේ අතර විවාහකයින් සැලකිය යුතු ප්‍රමාණයක් දැකිය හැකිය. මේ නිසා සමාජය තුළ විවිධ ගැටලු පැන නැගී ඇත. මේ නිසා අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධව ද ප්‍රශ්න පැන නැගී ඇත. අධ්‍යාපනය පවුලක් සතුවන සුවිශේෂ අංශයකි. බොහෝ දෙමව්පියන් විදේශගත වන්නේ පවුලේ අර්ථික ප්‍රශ්න හේතුවෙනි. ආර්ථික ප්‍රශ්න විසඳීමෙහිලා ඉවහල් වන දෙමාපියන් විදේශගත වීම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි කවරාකාරයේ බලපෑම් සිදු කරයි ද යන්න සොයාබැලීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.

මේ සඳහා අධ්‍යයන ප්‍රදේශය වශයෙන් පොල්ගහවෙල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තෝරාගත් අතර එම ප්‍රදේශයේ පාසල් 02 ක රැකියා සඳහා විදේශගත වූ දරුවන් 50 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. අධ්‍යයනය සඳහා මූලික වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික දත්ත උපයෝගී කරගත් අතර ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති පුද්ගලයන්ගෙන් තොරතුරු ලබා ගන්නා ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු, ප්‍රස්ථාර භාවිත කර ඇති අතර දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම හා කයි වර්ග පරීක්ෂාව භාවිත කර ඇත.

දත්ත විශ්ලේෂණයට අනුව දෙමව්පියන්ගේ විදේශගත වීමෙන් පසුව වුවද ළමුන් තුළ ඉගෙනීමට ඇති කැමැත්ත සම්බන්ධයෙන් සැලකිය යුතු පසුබැසීමක් දක්නට නොලැබේ. එහිදී දෙමව්පියන්ගේ විදේශගත වීමෙන් පසුව වුවද ඉගෙනීමට කැමැත්තක් දක්වන සිසුන් 76% ක් වාර්තා වී ඇත. එමෙන්ම පාසල් යාමට කැමැත්තක් දක්වන සිසුන් 86% ක් වාර්තා වේ. භාරකරුවන්ගෙන් 78%ක් ගුරු දෙගුරු රැස්වීම් වලට සම්බන්ධ වන අතර දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා භාරකරුවන්ගේ දායකත්වය ලැබෙන බවට ප්‍රතිචාර දැක්වූ සිසුන් 56% ක් වාර්තා වේ. නමුත් ප්‍රතිචාර දැක්වූ දරුවන්ගෙන් 63%කගේ ප්‍රතිචාරයන් මගින් පෙනී යන්නේ දෙමව්පියන් විදේශගත වීම පිළිබඳ ඔවුන්ගේ කැමැත්තක් නොමැති බවයි. දෙමව්පියන් විදේශගත වුවද තම අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව කර ගෙන යන බව 52%කගේ ප්‍රතිචාරයන් මඟින් පැහැදිලි වේ. එබැවින් දෙමව්පියන්ගේ විදේශගත වීම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි සැලකිය යුතු ආකාරයේ අහිතකර බලපෑමක් ඇති නොවන බව නිගමනය කළ හැකිය.

මුඛ්‍ය පද : විදේශ රැකියා, දෙමව්පියන්, සේවා නියුක්තිය, අධ්‍යාපනය, පවුල

1.ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය :ndasanayake7@gmail.com
2.ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය seetha@kln.ac.lk